JMC vLearning
"your virtual learning partner"

# ලිඛිත නියෝජනයන් (SLAuS 580)

## AAT අදියර III
FCA - මූල්‍ය පාලනයන් හා විගණනය


ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# AAT - අදියර III

# 303 - මූල්‍ය පාලනයන් හා විගණනය

## ලිඛිත නියෝජනයන් - SLAuS 580

ලිඛිත නියෝජනයක් යනු, යම් යම් කරුණු සනාථ කිරීම සඳහා හෝ වෙනත් විගණක සාක්ෂි සඳහා කළමනාකරණය විසින් විගණකවරයාට ලබා දී ඇත ලිඛිත ප්‍රකාශනයන්ය. ලිඛිත නියෝජනයන් ලබා ගැනීමේ විගණක අරමුණු වන්නේ,

- විගණකයට අදාල මූලික වගකීම් ඉටු කර ඇති බවට කළමනාරකණය විශ්වාස කරන බවට ලිඛිත නියොජනයක් ලබා ගැනීම.
- විගණක අවශ්‍යතාව මත හෝ විගණන ප්‍රමිත විසින් නියම කරනු ලැබුවහොත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල වෙනත් සාක්ෂි සඳහා සහාය වීම.

### කළමනාකරණයේ වගකීම් පිළිබඳ ලිඛිත නියෝජනයන්

විගණක විසින් පහත කරුණු සම්බන්ධයෙන් ලිඛිත නියෝජනයක් ලබා දෙන ලෙස කළමනාකාරීත්වයෙන් ඉල්ලා සිටිය යුතුය.

- විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අදාල මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන වගකීම කළමනාකරණය විසින් ඉටුකර ඇති බව.
- විගණන කාර්යයට අදාල සියළු තොරතුරු විගණකවරයාට ලබා දී ඇති අතර, සියළු ගණුදෙනු වාර්තා කර ඇති බව හා ඒවා මූල්‍ය ප්‍රකාශන තුලින් පිළිඹිබු වන බව.

### වෙනත් ලිඛිත නියෝජනයන්

SLAuS 580 හැරුණු විට, සමහර විගණක ප්‍රමිත නිශ්චිත කරුණු සම්බන්ධයෙන් ලිඛිත නියෝජනයක් අවශ්‍ය වේ නම්, විගණකවරයාට වෙනත් ලිඛිත නියෝජනයන් ඉල්ලා සිටිය හැක. එවැනි අවස්ථා සඳහා උදාහරණ ලෙස පහත දැ දැක්විය හැක.

- ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යෙදීම සුදුසු ද යන්න
- වත්කම් හා වගකීම් පොත් අගයට හෝ වර්ගීකරණයට බලපාන සැලසුම් හෝ අභිප්‍රායන්
- අනුකූල නොවීම ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවලට බලපාන නීතිවල අරමුණු, රෙගුලාසි හා ගිවිසුම්
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී වැදගත් උපකල්පන සාධාරණ බවට ලිඛිත නියෝජනය
- මූල්‍ය ප්‍රකාශනවල නිශ්චිත සැඳහුමක් පිළිබඳ ලිඛිත නියෝජනයක්
- නිවැරදි නොකරන ලද අවප්‍රකාශනයන්ගේ බලපෑම තනි තනිව හෝ සමස්ත වශයෙන් ප්‍රමාණාත්මක නොවන බවට ලිඛිත නියෝජනය

JMC vLearning "your virtual learning partner"

## ලිඛිත නියෝජනයන්ගේ ගුණාත්මක බව හා විශ්වාසනීයත්වය

- ලිඛිත නියෝජනයක්, ලිඛිත සාක්ෂි වන බැවින් විශ්වාසනීයකත්වයෙන් ඉහලය.
- නමුත් එය අභ්‍යන්තර ප්‍රභවයකින් ජනනය වන බැවින්, බාහිර ස්වාධීන සාක්ෂියක් තරම් විශ්වාසයක් නැත.
- බොහෝවිට මෙම ලිඛිත නියෝජනයන් සනාථ කර ගැනීමට තෙවන පාර්ශව සාක්ෂි ලබා ගැනීම දක්නට හැකිය.

## ලිඛිත නියෝජනයක් ලබා ගැනීම

සාමාන්‍යයෙන් විගණක වෙත යොමු කරන ලද නියෝජන ලිපියක ස්වරූපයෙන් ලිඛිත නියෝජනයන් ලබා ගනී.

එහිදී පහත දෑ ඇතුලත් කරයි.

- විගණක ආමන්ත්‍රණය කර තිබීම
- කළමනාකරණ ලිපි ශීර්ෂ කඩදාසි මත මුද්‍රණය කිරීම
- ඉහල කළමනාකරණය අත්සන් කිරීම
- නියෝජන ලිපියේ දිනය, විගණක වාර්තාවේ දිනයට ආසන්න දිනයක් වීම

## ලිඛිත නියෝජනයේ විශ්වාසනීයත්වය පිළිබඳ සැකය

ලිඛිත නියෝජනය, වෙනත් විගණක සාක්ෂි සමග නොගැලපේ නම්, පහත පටිපාටි සිදු කල යුතුය.

- කාරණය විසඳා ගැනීමට වෙනත් විගණක පටිපාටි සිදු කළ යුතුය.
- කළමනාකරණටය් නිපුණතාවය, අවංකභාවය හා සදාචාරාත්මක අගයන් පිළිබඳ නැවත තක්සේරු කල යුතුය.
- ලිඛිත නියෝජනයන් විශ්වාස නොවන බව විගණක නිගමනය කරන්නේ නම්, විගණක වාර්තාවට වන බලපෑම තීරණය කිරීම විගණක විසින් සිදු කල යුතුය.

## ලිඛිත නියෝජනයන් ලබා නොදීම

ලිඛිත නියෝජනයන් ලබා දීම කළමනාකරණය විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, විගණක විසින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

- කළමනාකරණය සමග සාකච්ඡා කිරීම
- කළමනාකරණයේ අවංක බව නැවත ඇගයීම හා නියෝජනයේ විශ්වාසනීයත්වය සහ පොදුවේ විගණක සාක්ෂි කෙරෙහි ඇති කල හැකි බලපෑම තක්සේරු කල යුතුය.
- විගණන වාර්තාවට ඇති බලපෑම තීරණය කිරීම ඇතුළුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

JMC vLearning "your virtual learning partner"